# 9 ප්‍රායෝගික ලේඛන

පහත දැක්වෙන්නේ නාමල්ගම මැදි මහ විදුහලේ ක්‍රීඩා සංවිධායක කමිටුවේ සමාජිකයන් අතර ඇති වූ කතාබහකි.

| | | |
|---|---|---|
| *ගයාන්* | : | අපේ ක්‍රීඩා උත්සවය හා සම්බන්ධ සියලු ම වැදගත් කරුණු සාකච්ඡා කරලා ආරාධනා පත්‍රයක් සකස් කරන්න කියලා ක්‍රීඩා භාර ගුරුතුමී කිව්වා නේ ද? |
| *චාමර* | : | ඔව්........... ඔව්.............. ඒ සඳහා අවශ්‍ය දේවල් අපි දැන් කතා කරමු. |
| *ඉසුරු* | : | ක්‍රීඩා උත්සවයට දිනයක් නියම කරගන්න ඕනෑ නේ ද? |
| *රවි* | : | ඊට ඉස්සරවෙලා ප්‍රධාන අමුත්තා කවුද කියලා තීරණය කරලා ඉඳිමු. |
| *ඉසුරු* | : | ඒ ඇයි ? |
| *රවි* | : | සමහර විට අපි නියමකර ගන්නා දිනය ප්‍රධාන අමුත්තාට නොගැළපෙන්න පුළුවනි නේ ද ? |
| *දීප්ති* | : | අපි දැනට තාවකාලික දිනයක් තීරණය කර ගනිමු ! |
| *කුමුදු* | : | ඔව්........... අපි මේ වාරයේ මැද දිනයක් යොදා ගනිමු. |
| *කුමුදු* | : | කවුද ප්‍රධාන අමුත්තා වශයෙන් කැඳවන්නේ ? |
| *ගයාන්* | : | අපේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් කැඳවමු. |
| *ඉසුරු* | : | අපේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමාටත් ආරාධනා පත්‍රයක් යවමු. |
| *චාමර* | : | මෙහේ ඉන්න විශේෂ ප්‍රභූවරුන්ටත් ආරාධනා පත්‍ර යවමු. |
| *දීප්ති* | : | ආදි ශිෂ්‍ය සංගමයේ අයියලා, අක්කලාටත් ආරාධනා කරමු. |
| *රවි* | : | නැතුව කොහොම ද? ඒ අය නේ අපට සිසිල් බීම දෙන්නේ. |
| *කුමුදු* | : | අපි එහෙනම්, මාර්තු 24 වන දිනට උත්සවය පවත්වමු. |
| *චාමර* | : | ඔන්න එහෙනම් දිනය හරි. |
| *ඉසුරු* | : | දැන් කොහේ ද ක්‍රීඩා උත්සවය පවත්වන්නේ ? |

*දීප්ති* : ඇයි, අපේ විදුහලේ පිට්ටනිය ලොකු මදි ද?

*ඉසුරු* : "නැහැ. මං හිතුවේ නාගරික ක්‍රීඩාංගනයේ ගනිමු ද කියලා?

*කුමුදු* : "නැහැ ............ නැහැ. අපේ ඉස්කෝලේ පිට්ටනිය හොඳයි."

*හැමෝ ම* : "ඔව් ............... ඔව් .................. ඒ තීරණයට අපි එකඟයි."

*ගයාන්* : "උත්සවය කීයට විතර පටන් ගත්තොත් ඇති ද? සරඹ සංදර්ශනයටත්, විකට ඇඳුම් තරගයටත්, සෑහෙන කාලයක් ගත වෙයි නෙ."

*චාමර* : "පස්වරු 6.30ට විතර අවසාන කරන්න බලාගෙන පස්වරු 2.30ට පටන් ගනිමු."

ඉහත සඳහන් කළ තොරතුරු ආශ්‍රයෙන් නාමල්ගම මැදි මහ විදුහලේ ක්‍රීඩා සංවිධායක කමිටුව සකස් කළ ආරාධනා පත්‍රය පහත දැක්වේ.

**එය කියවන්න.**

## *ආරාධනයයි !*

නාමල්ගම මැදි මහ විදුහලේ

**වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය**

**2008 මාර්තු 24 දින**
**පස්වරු 2.30 ට**

විදුහල් ක්‍රීඩාංගණයේ දී,

ඉබ්බාගමුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ
ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

මෙම අවස්ථාවට සහභාගී වන ලෙස
ඔබතුමාට / ඔබතුමියට
ගෞරවයෙන් ආරාධනා කරමු.

ලේකම්,
ක්‍රීඩා සංවිධායක කමිටුව.

නාමල්ගම ම.ම.වි,
නාමල්ගම,
ඉබ්බාගමුව.
2008.03.10

ඉහත දැක්වෙන ආරාධනා පත්‍රයට අනුව ආරාධනා පත්‍රයක අන්තර්ගත විය යුතු පොදු ලක්ෂණ හඳුනාගත හැකි ය.

- උත්සවය හෝ සිද්ධිය
- එය පැවැත්වෙන දිනය
- එය පැවැත්වෙන වේලාව
- එය පැවැත්වෙන ස්ථානය
- ප්‍රධාන ආරාධිතයකු වේ නම් ඔහුගේ නම
- ආරාධනය කරන්නේ කවුද යන්න
- ආරාධනා කරන දිනය
- අවශ්‍ය නම් ලිපිනය
- කරුණු කෙටියෙන් සටහන් කිරීම
- සිත් ගන්නාසුලු බව

මෙවැනි ආරාධනා පත්‍ර විවිධ රැස්වීම්, ගෙට ගෙවැදීම්, විවාහ මංගල්‍ය, විවෘත කිරීම්, මුල්ගල් තැබීම්, තරග, පින්කම්. ප්‍රදර්ශන ආදි විවිධ අවස්ථාවල සකස් කිරීමට සිදු වේ.

## ක්‍රියාකාරකම : 1

පහත දැක්වෙන වචන ප්‍රයෝජනයට ගෙන කොටුව තුළ ඇති ආරාධනා පත්‍රය සම්පූර්ණ කරන්න.

**ප්‍රදර්ශනය, විවෘත වේ, සාහිත්‍ය සංගමය, ආරාධනයයි, පවත්වනු ලබන, ආරාධනා, සහභාගි වන**

i. ........................................................................................ !

සිරිපුර මහා විද්‍යාලයයේ,

ii. ........................................... මගින් වාර්ෂික ව,

iii. ........................................... ලබන මහා පොත් iv. ...............................

**2008 මාර්තු 26 වන දින පෙරවරු 10.00 ට**

ගරු අධ්‍යාපන ඇමතිතුමා අතින් v. ....................................

එම උත්සවයට vi. ................................... ලෙස

ඔබට / ඔබ සැමට ගෞරවයෙන් vii. ...................................... කරමු.

ලේකම්,<br>
සාහිත්‍ය සංගමය.

විදුහල්පති,<br>
සිරිපුර ම.වි,<br>
සිරිපුර.<br>
2008.03.11

## ක්‍රියාකාරකම : 2

පහත දැක්වෙන ආරාධනා පත්‍රය කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

> *ආරාධනයයි !*
>
> **ව/ඉ/සමගිපුර මහා විද්‍යාලයයේ**
>
> සිසු දරු දැරියන්ගේ
> චිත්‍ර කලා හැකියාව නංවාලීම සහ
> නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින්
> පවත්වනු ලබන
>
> **චිත්‍ර ප්‍රදර්ශනය**
>
> **2008.05.26 වන දින**
> **පෙ.ව. 8.00 සිට ප.ව. 3.30**
> **විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ.**
>
> එය නැරඹීම සඳහා
> කෙරෙන
> ගෞරවනීය ආරාධනයයි.
>
> ව/ඉ/සමන්පුර මහා විද්‍යාලයීය
> චිත්‍රකලා අංශය.
>
> 2008.04.20

i. මේ ආරාධනය කුමක් සඳහා ද?
ii. පැවැත්වෙන දිනය, ස්ථානය, වේලාව දක්වන්න.
iii. ආරාධනය කරන්නේ කවුරුන් විසින් ද?

## ක්‍රියාකාරකම : 3

i. විවිධ උත්සව අවස්ථා සඳහා සැකසුණු ආරාධනා පත්‍ර එකතු කරන්න.
ii. ඒවා මිතුරන් සමග එකතු වී කියවන්න.
iii. ඔබ කැමති උත්සව අවස්ථාවක් සඳහා ආරාධනා පතක් සකස් කරන්න.

## ක්‍රියාකාරකම : 4

ඔබේ තොරතුරු ඇතුළත් කර පහත දක්වා ඇති පාසල් පුස්තකාල සාමාජික ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

### පුස්තකාල සාමාජික ඉල්ලුම් පත්‍රය

සම්පූර්ණ නම : ......................................................................................

ලිපිනය : ......................................................................................

......................................................................................

උපන් දිනය : ..................... දුරකථන අංකය : ......................

ශ්‍රේණිය : ......................................................................................

දිනය : ......................................................................................

..........................................

ශිෂ්‍යයාගේ අත්සන

## ක්‍රියාකාරකම : 5

පහත සඳහන් විස්තරය කියවන්න.

හසිත ජයසූරිය පුලස්තිපුර මහා විද්‍යාලයයේ ශිෂ්‍යයෙකි. ඔහු 8වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. ඔහුගේ නිවස පුලස්තිපුර 3 වන පටුමගේ අංක 12 දරන ස්ථානයේ පිහිටා තිබේ. ඔහු ඉපදුණේ 1994 පෙබරවාරි 28 වන දින ය. ශ්‍රී ලංකා රූපවාහිනී සේවයට ළමා නාට්‍ය ශිල්පීන් බඳවා ගැනීම සඳහා පුවත්පතක දැන්වීමක් පළකර තිබුණි. ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් යැවීමට ඔහු අදහස් කළේ ය.

හසිත ජයසූරිය ඔබ යයි සිතා පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

## රූපවාහිනී ළමා නාට්‍ය ශිල්පීන් බඳවා ගැනීමේ
## ඉල්ලුම් පත්‍රය

01. සම්පූර්ණ නම :

02. ලිපිනය :

03. උපන්දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

04. වයස : අවු ☐☐ මාස ☐☐

05. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ ( අදාළ කොටුව තුළ x ලකුණ යොදන්න )

06. ඉගෙන ගන්නා පාසල :

07. ඉගෙනුම ලබන ශ්‍රේණිය : ☐☐

මෙහි සඳහන් සියලු ම කරුණු නිවැරදි හා සත්‍ය බව සහතික කරමි.

දිනය : ....................................... ..................................................
ශිෂ්‍යයාගේ අත්සන

දිනය : ....................................... ..................................................
විදුහල්පතිවරයාගේ අත්සන